# දිවුරුම් ප්‍රකාශයයි

කොළඹ 07, බාන්ස් පෙදෙස, අංක 71/4 හි පදිංචි කපිල චන්ද්‍රසේන (ජා. හැ. අංක 196433810075) වන මා බෞද්ධාගමිකයකු වශයෙන් සත්‍ය ලෙසත්, අවංකවත්, ගාම්භිරතා පූර්වකව ප්‍රතිඥා දී ප්‍රකාශ කර සිටින වගනම්,

1) ඉහත සඳහන් ප්‍රතිඥා ප්‍රකාශක මම වෙමි.

2) මා ප්‍රකාශකර සිටින්නේ 2026.03.12 වන දින ප්‍රකාශයක් ලබා දීම සඳහා කරන ලද දැනුම් දීමකට අනුව මාගේ නීතිඥවරයා සමග මා අල්ලස් හා දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත ගිය බවයි.

3) මා ප්‍රකාශකර සිටින්නේ මාගේ ප්‍රකාශය සටහන් කරමින් සිටින අතරතුර, මාගේ ප්‍රකාශය සටහන් කරගන්නා ලද නිලධාරියා, ප්‍රකාශය සටහන් කරමින් සිටි කාමරයෙන් පිටතට ගොස් නැවත පැමිණ "සර් පොඩ්ඩක් යං" යනුවෙන් මට කතාකර, එකී විමර්ශන අංශය පිහිටා තිබූ එම ගොඩනැගිල්ලේ 3 වන මහලෙන් පිටතට රැගෙන ගොස් විදුලි සෝපානයෙන් මා එම ගොඩනැගිල්ලේ 1 වන මහලට රැගෙන ගිය බවත්, මා සමග නිලධාරීන් දෙදෙනෙකු ගිය බවත්, ඒ යන අතරතුර විදුලි සෝපානය තුළදී මා සමග ගිය එක් නිලධාරියෙක් "මය බයිලා කියලා ගරියන්නෙ නැහැ, අපිට ඔින දේ කියන්න, නැත්නම් ඇරෙස්ට් කරන්න වෙනවා" යනුවෙන් ප්‍රකාශ කළ බවත්, එවිට මා "සිද්ධ වුන දේ තමයි මම කියන්නේ, මම බයිලා කියන්නේ නැහැ" ලෙස ඔහුට ප්‍රකාශ කළ බවයි.

4) මා ප්‍රකාශකර සිටින්නේ ඉන් පසු මා එම ගොඩනැගිල්ලේ 1 වන මහලේ පිහිටි හිස් කාමරයක් තුළට රැගෙන ගොස් මා හට වාඩිවීමට සැලැස්වූ බවත්, කාමරයට ඇතුලුවන අවස්ථාවේදී තවත් නිලධාරියෙකු එකී කාමරයේ දොර අසල සිටි බවත්, මා සමග ගිය නිලධාරීන් දෙදෙනාද මා වාඩිකර එම කාමරයෙන් පිටත දොර ළග රැදී සිටි බවත්, ඉන් ස්වල්ප වේලාවකට පසු සුදු අත් දිග ෂර්ට් එකක්, කළු කලිසමක් සහ කළු ටයි පටියක් පැළැද සිටි අල්ලස් හා දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂක ජනරාල්වරයා වන රංග දිසානායක මහතා මා සිටි කාමරයට පැමිණි බවත්, එවිට මා සිට ගත් බවත්, ඔහු කාමරයට පැමිණෙන විටම මාගෙන් " මාව දන්නවා නේද" කියා ඇසූ බවත්, මම එවිට "ඔව් සර්" යනුවෙන් පැවසූ බවත්, ඔහු මා අසල වූ පුටුවේ වාඩිවී මා හට වාඩි වන ලෙස දැන්වූ බවයි.

5) මා ප්‍රකාශකර සිටින්නේ මෙම නඩුවේ සිද්ධිමය කරුණු සම්බන්ධයෙන්ම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ පවරා තිබූ B 14363/19 අංක දරණ නඩුවේ සැකකරුවෙකු වූ මා හට ඇප ප්‍රධානය කිරීමේ නියෝගය කරන ලද්දේ වර්තමාන අධ්‍යක්ෂක ජනරාල්වරයා වන රංග දිසානායක මහතා කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ ගරු

මහේස්ත්‍රාත්වරයා ලෙස කටයුතු කරනු ලබන අවදියේදී බවත්, ඒ අනුව මම ඔහුව දන්නා බවත්, ඔහු අල්ලස් හා දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂක ජනරාල්වරයා ලෙස පත් වූ පසු රූපවාහිනියෙන්ද මා ඔහුව දැක ඇති බවයි.

6) මා ප්‍රකාශකර සිටින්නේ ඉන් අනතුරුව එකී රංග දිසානායක මහතා තර්ජනාත්මක ස්වරයෙන් මා අමතා "මේ ඔයාගෙ අන්තිම චාන්ස් එක, මීට සති දෙක තුනකට කලින් මේ වගේම කෙනෙක් ආවා, තමුනුත් දන්නව ඇතිනෙ කවුද කියල, දන්නේ නැත්නම් මම කියන්නම්, ඒ කෙහෙළියගෙ නඩුවෙ කෙනෙක්, මිනිහට මම චාන්ස් දෙකක් දුන්නා, ගත්තෙ නෑ, මිනිහට ඉන්ඩයික්ට්මන්ට් දෙන දවසට කලින් මිනිහා එල්ලිලා මැරුණා, තමුන්ගෙ එකේ ඉන්න අය මම දන්නවා, මහ එකාගෙ නමයි, පොඩි එකාගෙ නමයි කියනවා, අනික තමුන්ගෙ වයිෆ් ගැන" යනුවෙන් පැවසූ බවත්, එවිට මා ඔහුගේ මුහුණ දෙස බලා සිටි බවත්, එවට ඔහු ඇයි තේරුනේ නැද්ද, මහින්දයි, නාමලුයි ගැන කියනවා, මම ප්‍රඩිෂරී එකෙන් මෙතනට ආවේ සුද්ද කරලම දාන්න, ඒක මං කරනවා, මේ චාන්ස් එක ගන්නවා, නැත්නම් ඉතිං තමුන්ටත් අර මිනිහා කරගත්ත දේ, බෙල්ලෙ වැළ දා ගන්න තැනට මම වැඩ කරනවා" යනුවෙන් තර්ජනය කර ඔහු කාමරයෙන් පිටව ගිය බවයි.

7) මා ප්‍රකාශකර සිටින්නේ ඉන්පසු මා සමග පැමිණි නිලධාරීන් දෙදෙනා නැවතත් මා 3 වන මහලට රැගෙන යන අතරතුර ප්‍රකාශය ලබාදීම සම්බන්ධයෙන් මාගේ නීතිඥවරයාගෙන් උපදෙස් ලබා ගැනීමට අවශ්‍ය බව එම නිලධාරීන්ට දැනුම් දුන් විට "ඔයා ප්‍රකාශෙ දෙන ගමන්නෙ තාම ඉන්නේ, ඒ හින්දා ඉවරවෙනකන් නීතිඥ මහත්තයා හම්බවෙන්න දෙන්න බැහැ" යනුවෙන් පැවසූ බවයි.

8) මා ප්‍රකාශකර සිටින්නේ ඉහත තර්ජනය කිරීම හේතුවෙන්, අල්ලස් හා දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂක ජනරාල්වරයා විසින් රූපවාහිනියේ සිදුකරන ලද කතා ඇසීමෙන් ඔහු හරිදේ කරන කෙනෙකු යැයි මාගේ සිතේ ඇඳී තිබූ ප්‍රතිරූපය නැතිවී ගිය බවත්, අධ්‍යක්ෂක ජනරාල්වරයා විසින් සිදුකරන ලද බලපෑම සහ තර්ජනය හේතුවෙන් මා බියට සහ තැතිගැන්මට ලක් වූ බවත්, මා හටද මාගේ ජීවිතය එපා කරවා මා හටද එල්ලී මිය යාමට තරම් මාගේ සිතට දරාගත නොහැකි පීඩනයක් අල්ලස් හා දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂක ජනරාල්වරයා විසින් එල්ල කරනු ඇති බවට වූ බය නිසා මාගෙන් ප්‍රකාශය ලබා ගත් නිලධාරීයාට අවශ්‍ය ලෙස හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේද, පාර්ලිමේන්තු මන්ත්‍රී නාමල් රාජපක්ෂ මහතාගේද, මාගේ බිරිඳගේද නම් ඇතුලුව එම ප්‍රකාශය ලබා දුන් බවයි.

9) මා ප්‍රකාශකර සිටින්නේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ හෝ පාර්ලිමේන්තු මන්ත්‍රී නාමල් රාජපක්ෂ මහතාගේ නම් සහ ඔවුන් විසින් ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ එයාර්බස් ප්‍රතිස්ථාපන ක්‍රියාවලියේදී යම් බලපෑමක් සිදු කළ බව හෝ යම් අයුතු දායකත්වයක් දැක්වූ බව හෝ යම් මුදලක් ලබා ගත් බව සහ මාගේ බිරිඳගේ දායකත්වයක් තිබූ බවට මාගේ ප්‍රකාශයේ කුමන හෝ ස්ථානයක අඩංගු වේ නම්, එම කරුණු මා ස්වේච්ඡාවෙන් සිදු කරන ලද්දක් නොව, එම කරුණු අල්ලස් හා දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂක ජනරාල්වරයාගේ

බිය ගැන්වීම සහ තර්ජනය කිරීම මත ඇතිවූ මරණ බිය ප්‍රයෝජනයට ගනිමින් මාගේ ප්‍රකාශය ලබා ගන්නා ලද නිලධාරියා විසින් ලබා ගන්නා ලද කරුණු වන බවයි.

ඉහත දිවුරුම් ප්‍රකාශයේ අන්තර්ගතය ප්‍රතිඥා ප්‍රකාශක විසින් කියවා තේරුම්ගෙන සත්‍ය බවට පිළිගෙන, ප්‍රතිඥා දී වර්ෂ 2026 ක් වූ මාර්තු මස 18 වන දින මා ඉදිරියේ කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයේ දී අත්සන් කරන ලදි.

මා ඉදිරිපිටදීය

දිවුරුම් කොමසාරිස්

H.P.C. Samantha Kumary
Attorney-at-Law, Notary Public
Registered Company Secretary &
Commissioner for Oaths
No. 391/3/6, Dam Street, Colombo - 12
Tel : 077 4434911
Email : rsamantha70[illegible]@gmail.com




බර/සැකකරු අංක 1853 ...
බන්ධනාගාර ...... නැමති අය 2026/03/18
දින කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයේදී
මා ඉදිරියේදී අත්සන් කරන ලදී

............................................
[illegible] (විනය)
කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය